# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,507 — 1965 සැප්තැම්බර් 16 වැනි බ්‍රහස්පතින්ද — 1965.9.16

*(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)*

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 18/65 දරණ ආනයන පාලන දැන්වීම

**ඒකාන්ත පරිහරණාකාර බලපත්‍ර දීමනා පරිපාටිය—වැඩපලවලට අවශ්‍ය අත් ඔර්ලෝසු සහ ලොකු ඔර්ලෝසු සඳහා අමතර කොටස්—1965**

පහත දක්වෙන කරුණුවලට ගැලපේ නම් අත් ඔර්ලෝසු සහ ලොකු ඔර්ලෝසු නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ යෙදී සිටින වැඩපොළවල් වලින් අත් ඔර්ලෝසු සහ ලොකු ඔර්ලෝසුවලට අවශ්‍ය අමතර කොටස් සඳහා පමණක් පහත නියමිත ආකෘතියෙන් ඇති ඒකාන්ත පරිහරණාකාර අයැදුම් පත් පිළිගනු ලැබේ :—

(ඒ) වැඩපොළේ ඒකාන්තයෙන්ම නියුක්ත සේවක සංඛ්‍යාව හයකට (6) නොඅඩු වීම ;

(බී) ව්‍යාපාරය ලේඛනගත කිරීමට අදාල ලිපි ලේඛනාත්මක සාක්ෂි, ව්‍යාපාරයේ පරිමාව, ආදයම් බදු තක්සේරුව සහ 1964 වර්ෂයේදී ගන්ට යෙදුණු බඩු මිළ මෙම පාලනය වෙත සැපයීම.

2. මෙම දැන්වීම යටතේ සියලුම අයැදුම්පත් පිටපත් දෙකකින් යුක්තව 1965 සැප්තැම්බර් මස 25 වෙනි දිනට ලැබෙන සේ මෙම පාලනයේ " සී " අංශයට එවිය යුතුය.

3. මීට පෙර අයැදුම්පත් එවන ලද අයැදුම්කරුවන් විසින් මෙම දැන්වීම යටතේද අයැදුම් කරනු මැනවි.

ඊ. ඇම්. විජේනායක,
ආනයන හා අපනයන පාලක.

1965 සැප්තැම්බර් මස 15 දින,
කොළඹ දීය.

### සඳහන් කළ අයැදුම්පත් ආකෘතිය (පිටපත් දෙකකින්)

1. නම සහ ලිපිනය :————.
2. ව්‍යාපාරය ලේඛනගත අංකය (ව්‍යාපාරික ලේඛනගත සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
3. 1963 හෝ 1964 තුළදී ව්‍යාපාරය පිළිබඳ වාර්ෂික වෙළඳ පිරිවැටුම (වෙළඳ ගිණුමේ සහ ශේෂ පත්‍රයේ සහතික කළ පිටපතක් සැපයිය යුතුය) :————.
4. දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ ගොනු අංකය :————.
5. (ඒ) 1963 ; (බී) 1964 තුළදී මෙරටදී මිළට ගත් අමතර කොටස්වල සම්පූර්ණ වටිනාකම (1963 සහ 1964 තුළ මෙරට දී මිළට ගත් බව සනාථ කිරීම සඳහා මුදල් කුවිතාන්සි සහ වෙනත් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය) :————.
6. (ඒ) 1964; (බී) 1965 වර්ෂවලදී අමතර කොටස් ආනයනය කළා නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම (මෙම පාලනයෙන් නිකුත් කළ බලපත්‍රවල අංකයන් සහ දිනයන් සඳහන් කළ යුතුය) :————.
7. වැඩපොළ :
   (ඒ) පිහිටීම :————.
   (බී) යන්ත්‍ර සහ උපකරණ වෙනුවෙන් ප්‍රාග්ධන ආයෝජනය :————.
   (සී) ඒකාන්ත වශයෙන් සේවයේ යෙදී සිටින පුද්ගලයින්ගේ ගණන :————.
8. 1965 වර්ෂය තුළදී අවශ්‍ය සම්පූර්ණ ගණන් මිනුම් ඉදිරිපත් කරන්න (1965 වර්ෂයට අවශ්‍ය පංගු කොටස්වල මුළු වටිනාකම සමග ඔබේ අවශ්‍යතාවයන්ගේ සම්පූර්ණ විස්තර දෙන්න—1965 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා) :————.
9. විදේශීය සැපයුම්කාරයාගේ/සැපයුම්කාරයින්ගේ නම සහ ලිපිනය :————.

ඉහත දක්වෙන විස්තර හැම අතින්ම සැබෑ බවටත් නිවැරදි බවටත් මම/අපි මෙයින් සහතික කරමි/කරමු.

————,
අයදුම්කරුගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

9–843

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1347——ආර් 8857—8,375 (65/9)